## පරිගණකය

# SFT ප්‍රශ්න සහ පිළිතුරු

A/L Tech කරන හැමෝම ඉන්න ඕනෙ තැනක් **techlogiclk.com**

ජාතික අධ්‍යාපන දෙපාර්තුමේන්තුව මඟින් නිකුත් කළ Quiz Bank එකෙහි ඇති ප්‍රශ්න පාඩමෙන් පාඩමට වෙන් කළ සැකසූ PDF එකතුව.

## ඒකකය 07

## පරිගණකය

### බහුවරණ ප්‍රශ්න

1. අත්ලෙහි තබා ගෙන ක්‍රියා කරවිය හැකි කුඩා පරිගණකයකට උදාහරණයකි.
   1. ලැප්ටොප් පරිගණකය 2. සුපිරි පරිගණකය 3. මධ්‍ය පරිගණකය
   4. මහා පරිගණකය 5. (PDA) පුද්ගල අංකිත සහකරු
2. පහත ඒවායින් සැකසුම් හැකියාව ඉහළ ම පරිගණකය තෝරන්න.
   1. මධ්‍ය පරිගණකය 2. ක්ෂුද්‍ර පරිගණකය 3. සුපිරි පරිගණකය
   4. ටැබ්ලට් පරිගණකය 5. මහා පරිගණකය
3. පරිගණක පද්ධතියක මූලික ක්‍රියාවලියට අයත් නො වන්නේ,
   1. ආදානය කිරීම 2. සකස් කිරීම 3. ආචයනය කිරීම
   4. වර්ගීකරණය 5. ප්‍රතිදානය කිරීම
4. පරිගණක පද්ධතියක ප්‍රතිදාන උපාංගයකට (Output Devices) උදාහරණයක් නො වන්නේ,
   1. මුද්‍රකය (Printer) 2. මොනිටරය (Moniter) 3. ජොයිස්ටික් (Joystic)
   4. ප්ලොටරය (Plotter) 5. නාදකය (Speaker)
5. චෙක්පතක පහළින් පිහිටි තීරුව තුළ ඇති මුද්‍රිත අකුරු හඳුනා ගත හැකි ආදාන උපාංගය වන්නේ,
   1. OMR (Optical mark reader) 2.MICR (Magnetic ink character reader) 3. OCR (Optical character reader)
   4. Barcode Reader 5. FB-Scanner
6. තිර දැක්කුම් උපාංගයකට (Pointing Device) උදාහරණ වන්නේ?
   1. මාර්ග ගුලාව (Track Ball) 2. ප්‍රකාශ පෑන (Light pen) 3. මූසිකය (Mouse)
   4. ස්පර්ශ සංවේදී තිරය (Touch screen) 5. ඉහත සියල්ල ම
7. පහත දැක්වෙන උපකරණ අතරින් ආදාන උපකරණ ලෙස සැලකිය හැක්කේ,
   A. ස්පර්ශ සංවේදී තිරය (Touch Screen)
   B. තීරු කේත කියවනය (Barcode Reader)
   C. නාදකය (Speaker)
   D. මයික්‍රොෆෝනය (Microphone)
   1. A හා B ය 2. B හා C ය 3. A, B හා D ය
   4. B, C හා D ය 5. A, B හා C ය
8. සිසුවෙක් නවීන ජංගම දුරකථනයකින් ඡායාරූපයක් ගෙන එය සිය සමාජ ජාල වෙබ් අඩවියට ඇතුළත් කරයි. මෙහි දී ජංගම දුරකථනය ක්‍රියාකරන්නේ?
   1. ප්‍රතිදාන උපක්‍රමයක් ලෙස පමණි.
   2. ආදාන හා ප්‍රතිදාන උපක්‍රමයක් ලෙස ය.
   3. අදාන උපක්‍රමයක් ලෙස පමණි.
   4. ගබඩා කිරීමේ උපක්‍රමයක් ලෙස පමණි.
   5. ජාල උපාංගයක් ලෙස ය.
9. සිසුවෙක් තම ජීව දත්ත සටහන (Bio Data) සඳහා සිය ඡායාරූපයක් ඇතුළත් කිරීමට බලාපොරොත්තු වෙයි. පහත උපාංග අතරින් මේ සඳහා සුදුසු වන්නේ ?
   1. සුපරීක්ෂණය (Scanner)
   2. ප්‍රකාශ අකුරු කියවනය (OCR)
   3. ප්ලොටරය (Plotter)
   4. මාර්ග ගුලාව (Track Ball)
   5. මුද්‍රකය (Printer)
10. විදුලි පරිභෝජනය අවම, දෘශ්‍ය දර්ශන ඒකකය (VDU) වන්නේ,
    1. LCD මොනිටරය 2. LED මොනිටරය 3. CRT මොනිටරය
    4. OLED මොනිටරය 5. Plasma මොනිටරය
11. 2 MB මතකය තුල්‍ය වන්නේ,
    1. 2048 byte ට ය. 2. $2 \times 10^{21}$ kB ට ය. 3. $2^{24}$ Bits ට ය.
    4. $2^{20}$ kB ට ය. 5. $2^{21}$ kB ට ය.

12. පහත සඳහන් තොරතුරු ගබඩා කරන මාධ්‍ය සලකන්න.
    A. නම්‍ය තැටිය (Floppy Disk)
    B. සැනෙලි මතකය (Flash Drive)
    C. දෘඪ තැටිය (Hard Disk)
    D. නිල් කිරණ තැටිය (Blu-Ray Disk)

    මේවා අතරින් බාහිර ලෙස තොරතුරු ගබඩා කරන මාධ්‍ය වන්නේ?
    1. A හා B ය
    2. B හා C ය
    3. A, B හා D ය
    4. B, C හා D ය
    5. ඉහත සියල්ල ම
13. පහත දී ඇති ගබඩා කරන මාධ්‍ය අතරින් වැඩි ම ධාරිතාව ඇති මාධ්‍ය වන්නේ
    1. චුම්බක පටි (Magnetic Tape)
    2. දෘඪ තැටි (Hard Disk)
    3. සංයුක්ත තැටි (CD)
    4. නිල් කිරණ තැටි (Blu-ray Disk)
    5. මතක පෙති (Memory Chip)
14. ප්‍රකාශ ආවරණ උපක්‍රමයක් නො වන්නේ?
    1. සැනෙලි මතකය (Flash Memory)
    2. සංයුක්ත තැටි (CD)
    3. නිල් කිරණ තැටි (Blu-ray Disk)
    4. සංඛ්‍යාංක බහු විධි තැටි (DVD)
    5. ඉහත කිසිවක් නොවේ.
15. ................................ මගින් යතුරු පුවරුව මගින් ඇතුළත් කරනු ලබන සියලු අනුලක්ෂණ (Characters) නිරූපණය කළ හැකි ය.
    1. බයිටයක්
    2. බිටුවක්
    3. කිලෝ බයිටයක්
    4. බයිට් දෙකක්
    5. මෙගා බයිටයක්
16. සිසුවෙක් තම පරිගණකය තුළින් දෘශ්‍ය ගොනුවක් (Video File) නැරඹීමේ දී එය සුමට ලෙස ධාවනය නො වන බව පවසා ඒ සඳහා බලපෑ හැකි හේතුව කුමක් දැයි සිය ගුරුවරයාගෙන් විමසයි.

    ගුරුවරයා විසින් ලබා දුන් පිළිතුරට වඩාත් ම ආසන්න පිළිතුර විය හැක්කේ?
    1. දෘඪ තැටියේ (Hard Disk) ධාරිතාව ප්‍රමාණවත් නො වීම.
    2. පාඨන මාත්‍ර මතකය (ROM) ප්‍රමාණවත් නො වීම.
    3. සසම්භාවී ප්‍රවේශ මතකය (RAM) ප්‍රමාණවත් නො වීම.
    4. වාරක මතකය (Cache Memory ) ප්‍රමාණවත් නො වීම.
    5. දෘශ්‍ය මතකය (Video Memory) ප්‍රමාණවත් නො වීම.
17. LCD හා CRT මොනිටර් සැසඳීමේ දී CRT මොනිටරයේ ඇති ගුණාංගයක් වන්නේ?
    1. විදුලි පරිභෝජනය අඩු වීම.
    2. අඩු තාපයක් ජනනය කිරීම.
    3. ඉඩ ප්‍රමාණය අඩුවෙන් ගැනීම.
    4. නැරඹුම් පරාසය වැඩි වීම (Viewing Angle)
    5. පහසුවෙන් ප්‍රවාහනය කළ හැකි වීම.
18. පහත සඳහන් කෙවෙනි (Port) සලකන්න.
    A. PS2
    B. RJ45
    C. USB
    D. HDMI

    මේවා අතරින් මූසිකය සම්බන්ධ කළ හැක්කේ?
    1. A පමණි
    2. A හා B පමණි
    3. A හා C පමණි
    4. B හා C පමණි
    5. A,B හා C පමණි
19. වර්තමාන පරිගණකවල USB කෙවෙනිය ජනප්‍රිය කෙවෙනියකි. මෙහි USB ලෙස හඳුන්වන්නේ?
    1. Unitron Serial Bus
    2. Universal Serial Bus
    3. Universal Service Bus

4. Universal Serial Bit　　5. Unitron Serial Bit

20. නීතිඥවරයෙකු තම ලිපිලේඛන කටයුතු කර ගැනීම සඳහා මුද්‍රණ වියදම අඩු නමුත් මුද්‍රණ පිටපත නො වෙනස් ව දිගු කල් පවත්වා ගත හැකි අයුරින් මුද්‍රණය කර ගැනීමට සුදුසු මුද්‍රණ යන්ත්‍රයක් පිළිබඳ ව ඔබෙන් විමසයි නම් ඒ සඳහා ඔබ නිර්දේශ කරන්නේ පහත මුද්‍රණ යන්ත්‍රවලින් කවරක් ද?
1. Dot matrix Printer　　2. Lazer Printer　　3. Ink-jet Printer
4. Thermal Printer　　5. Bubble-jet Printer

21. පාඨන මාත්‍ර මතකය (ROM) පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
A- එහි පරිගණකය ක්‍රියාත්මක වීමට අවශ්‍ය මූලික උපදෙස් අඩංගු ව ඇත.
B- මෙය ද්විතීය මතකයට උදාහරණයකි.
C- පරිගණයට සපයන විදුලිය ඉවත් කළ ද, මෙහි තොරතුරු නො වෙනස් ව පවතී.
ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,
1. A පමණි　　2. B පමණි　　3. A හා B පමණි
4. A හා C පමණි　　5. C හා B පමණි

22. පහත දී ඇති මුද්‍රණ යන්ත්‍ර සලකන්න.
A- Dot matirx Printer
B- Lazer Printer
C- Daisy Wheel Printer
D- Ink-jet Printer
ඉහත ඒවායින් ඝට්ටන මාධ්‍ය (Impact Printer) මුද්‍රණ යන්ත්‍ර වන්නේ,
1. A පමණි　　2. B හා D පමණි　　3. A හා C පමණි
4. A හා D පමණි　　5. C හා D පමණි

23. ආචයන උපක්‍රම (Storage Devices) ධාරිතාව වැඩි එකෙහි සිට ධාරිතාව අඩු එක දක්වා පෙළ ගස්වා ඇත්තේ පහත කුමකින් ද?
1. සැනෙලි මතකය, දෘඪ තැටිය, ප්‍රධාන මතකය, නම්‍ය චුම්බක තැටිය.
2. ප්‍රධාන මතකය, සැනෙලි මතකය, නම්‍ය චුම්බක තැටිය, දෘඪ තැටිය.
3. නම්‍ය චුම්බක තැටිය, දෘඪ තැටිය, සැනෙලි මතකය, ප්‍රධාන මතකය.
4. දෘඪ තැටිය, නම්‍ය චුම්බක තැටිය, සැනෙලි මතකය, ප්‍රධාන මතකය
5. දෘඪ තැටිය, සැනෙලි මතකය, ප්‍රධාන මතකය, නම්‍ය චුම්බක තැටිය

24. පරිගණකය සතු ගති ලක්ෂණයක් නො වන්නේ?
1. වේගවත් බව　　2. බහු කාර්යය බව　　3. නිරවද්‍යතාව
4. බුද්ධියක් නැති බව　　5. බහුශ්‍රැත බව

25. ආචයන උපක්‍රම (Storage Devices) ඒවායේ ප්‍රවේශ වේගයන්ට (Access Speeds) අනුව වැඩි ම වේගයේ සිට අඩු ම වේගය දක්වා අනු පිළිවෙළට දක්වා ඇත්තේ පහත කුමන පිළිතුරේ ද?
1. රෙජිස්තරය, වාරක මතකය, ප්‍රධාන මතකය, දෘඪ තැටිය
2. දෘඪ තැටිය, ප්‍රධාන මතකය, වාරක මතකය, රෙජිස්තරය
3. දෘඪ තැටිය, රෙජිස්තරය, ප්‍රධාන මතකය, වාරක මතකය
4. රෙජිස්තරය, ප්‍රධාන මතකය, වාරක මතකය, දෘඪ තැටිය
5. වාරක මතකය, රෙජිස්තරය, ප්‍රධාන මතකය, දෘඪ තැටිය

26. 2048 බයිට්(Byte) සමාන වනුයේ?
1. 2 GB　　2. 2 MB　　3. 1 GB
4. 1 TB　　5. 2 Kb

27. පරිගණකයට නිර්බාධක ජව සැපයුමක් (UPS) භාවිත කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ?
1. පරිගණක අභ්‍යන්තරයේ බැටරිය ආරෝපණය කිරීමයි.
2. අකුණු සැරවලින් ආරක්ෂා කිරීමයි.
3. පරිගණකයට ලැබෙන විදුලිය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීමයි.
4. විදුලිය බිඳ වැටීමක දී විදුලිය ලබා දීමයි.
5. ඉහත කිසිවක් නොවේ.

28 පරිගණකයේ වේගයට අඩුම බලපෑමක් ඇති කරනු ලබන්නේ පහත කුමකින් ද?
1. සසම්භාවී ප්‍රවේශ මතකයෙන්

2. ක්ෂුද්‍ර සකසනයේ හෝරා ශීඝ්‍රතාවයෙන්
3. දෘඪ තැටියේ ධාරිතාවයෙන්
4. වාරක මතකයෙන්
5. මෙහෙයුම් පද්ධතියෙන්

29. පහත දැක්වෙන ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. සැනෙලි මතකයක (Flash Drive) ධාරිතාව සංයුක්ත තැටියකට වඩා අඩු ය.
2. Blu-Ray තැටියක් DVD ධාවකයකින් කියවිය හැකි ය.
3. චුම්බක පටිවල ධාරිතාව ඉතා ඉහළ අතර උපස්ථ පිටපත් තබා ගැනීමට භාවිත වේ.
4. සසම්භාවී ප්‍රවේශ මතකයේ වේගයට වඩා සැනෙලි මතකයේ වේගය වැඩි ය.
5. DVD තැටියක් සංයුක්ත තැටි (CD) ධාවකයකින් කියවිය හැකි ය.

30. නවීන පරිගණකවල අනුක්‍රමණ තොට (Serial Port) හා සමාන්තර තොට (Parallel Port) භාවිතයෙන් ඉවත් වී තිබේ . මේ සඳහා බලපෑ හේතු මොනවා ද?
A. USB තොට භාවිතයට පැමිණීම.
B. අනුක්‍රමණ තොට හා සාමාන්තර තොට ප්‍රමාණයෙන් විශාල වීම.
C. අනුක්‍රමණ හා සමාන්තර තොටවල දත්ත ප්‍රවේශ වේගය අඩු වීම.
D. අනුක්‍රමණ හා සමාන්තර තොටවලට සම්බන්ධ කළ හැක උපාංග සීමා සහිත වීම.
E. නවීන ආදාන/ප්‍රතිදාන උපාංග අනුක්‍රමණ හා සමාන්තර තොට සඳහා ප්‍රතිචාර නො දැක්වීම.

1. A,B හා D පමණි. 2. A, C හා E පමණි. 3. B, D හා E පමණි.
4. A හා B පමණි. 5. ඉහත සියල්ලම.

31. විදුලිය විසන්ධි වීමක දී පසුත් තොරතුරු රඳා පවතින්නේ පහත කුමක් තුළ ද?
1. CPU 2. RAM 3. ROM
4. Registor 5. Cache

32. ඝන අවස්ථා මතක උපාංග (Solid State Memory Device) පහත කුමකින් නිරූපණය කරයි ද?
1. දෘඪ තැටි (Hard Disk, CD)
2. සැනෙලි මතකයන් (Flash Memory, SD Card)
3. චුම්බක තැටි (Magnetic Tape, Floppy Disk)
4. CD, DVD
5. Blu-ray Disk, CD, DVD

33. පහත සඳහන් කුමකින් දෘශ්‍ය කවුළු (Video Port) පමණක් නිරූපණය කරන්නේ ද?
1. VGA, DVI, HDMI 2. VGA, HDMI, RCA 3. VGA, S-Video, USB
4. VGA, S-Video, PS/2 5. USB, VGA

34. ගබඩා කිරීමේ උපාංගවල (Storage Device) විකාශනය නිවැරදි ව දැක්වෙන්නේ?
1. Floppy Disk, Hard Disk, Sky Drive, DVD
2. Floppy Disk, Hard Disk, Flash Drive, DVD
3. Punch Card, Hard Disk, Blue-Ray Disk, Flash Drive
4. Punch Card, Floppy Disk, Hard Disk, DVD, Sky Drive
5. Floppy Disk, DVD, Hard Disk, Sky Drive

35. මුද්‍රණ යන්ත්‍රයක පහත ලක්ෂණ අඩංගු වෙයි.
A. මුද්‍රණයේ දී හඬක් නංවයි.
B. මුද්‍රණ වේගය අඩු ය.
C. මුද්‍රණ පිටපත්වල ප්‍රමිතිය අඩු නමුත් මුද්‍රණ වියදම අඩු ය.

මෙම මුද්‍රණ යන්ත්‍රය විය හැක්කේ,
1. Dot matrix Printer 2. Ink-Jet Printer 3. Laser-Jet Printer
4. Thermal Printer 5. Screen Printing

36. පරිගණකවල සකසනයන් (Processor) නිපද වන ජනප්‍රිය නිෂ්පාදන ආයතනයක් වන්නේ?
1. ගූගල් (Google) 2. මයික්‍රොසොෆ්ට් (Microsoft)
3. ඇඩෝබි (Adobe) 4. ඉන්ටෙල් (Intel)
5. ඩෙල් (Dell)

37. වර්තමාන වෙළෙඳපොළේ ඇති පෞද්ගලික පරිගණකයක සසම්භාවී ප්‍රවේශ මතක (RAM) යේ ධාරිතාව ලෙස ගණන් ගත හැක්කේ?
1. 4 KB 2. 4MB 3. 4GB

4. 4TB
5. 4 Byte

38. පහත දැක්වෙන මතක අතරින් නශ්‍ය නො වන මතක (Non Volatile Memory) වන්නේ මොනවා ද?
   A. සසම්භාවි ප්‍රවේශ මතකය (Random Access Memory)
   B. පාඨන මාත්‍ර මතකය (Read Only Memory)
   C. වාරක මතකය (Cache Memory)
   D. රෙජිස්තර මතකය (Register Memory)

1. A පමණි
2. B පමණි
3. B හා C පමණි
4. A හා D පමණි
5. C හා D පමණි

39. ඩිජිටල් කැමරාවක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු ලක්ෂණයක් වන්නේ ඡායාරූපයක විභේදනයයි (Resolution). මෙය මනිනු ලබන්නේ ?

1. Mega Bits
2. Mega Herzs
3. Mega Bytes
4. Mega Pixcel
5. Killo Byte

---

## බහුවරණ - (පිළිතුරු)

| | | | |
|---|---|---|---|
| 1-5 | 11-3 | 21-4 | 31-3 |
| 2-3 | 12-3 | 22-3 | 32-2 |
| 3-4 | 13-2 | 23-5 | 33-1 |
| 4-3 | 14-1 | 24-5 | 34-4 |
| 5-2 | 15-1 | 25-1 | 35-1 |
| 6-5 | 16-3 | 26-5 | 36-4 |
| 7-3 | 17-4 | 27-4 | 37-3 |
| 8-2 | 18-3 | 28-3 | 38-2 |
| 9-1 | 19-2 | 29-3 | 39-4 |
| 10-2 | 20-1 | 30-5 | |